# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1717/6 - 2011 අගෝස්තු මස 02 වැනි අඟහරුවාදා - 2011.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 19/72.

### 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත

1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 10 වැනි වගන්තිය යටතේ වරාය සහ මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
වරාය සහ මහාමාර්ග අමාත්‍ය.

2011 ජූලි මස 18 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝගය 2011 නැව් බඩු ගෙනයන්නන්ට සහ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට (බලපත්‍ර ලබාදීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2012 ජනවාරි මස 01 වැනි දින සිට බලාත්මක විය යුතු ය.

2. නැව් බඩු ගෙනයාමේ ව්‍යාපාරය හෝ යාත්‍රා ක්‍රියාකරුවකු නොවන පොදු ප්‍රවාහකයකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාමට අදහස් කරන සෑම සමාගමක් ම මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව (මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත තත්කාර්යය සඳහා බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

3. බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක ම ඒ ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය වන සියලු තොරතුරු අඩංගු විය යුතු අතර, එම ඉල්ලීම සමඟ අදාළ ගාස්තුව ද ඉදිරිපත් කළ යුතු ය.

4. ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් වෙනසක් සිදු වුවහොත්, ඒ පිළිබඳව ප්‍රමාදයකින් තොරව ඉල්ලුම්කාර සමාගම විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට තොරතුරු ලබාදෙන බවට ලිඛිත ප්‍රකාශයක් ද බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් සමග ම ඉදිරිපත් කළ යුතු ය.

5. යම් සමාගමක් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි පිහිටුවනු ලැබ ලියාපදිංචි කර ඇති හෝ නැවත ලියාපදිංචි කර ඇති සහ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරය ශ්‍රී ලාංකිකයන් වන්නා වූ ද, එකී සමාගමේ නිකුත් කළ ඡන්ද අයිතිය හිමි කොටස්වලින් සියයට හැටකට අඩු නොවන ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන තැනැත්තන්ට අයත්වන වගකීමෙන් සීමිත පොදු හෝ පුද්ගලික සමාගමක් නම් මිස නැව් බඩු ගෙනයාමේ ව්‍යාපාරය හෝ යාත්‍රා ක්‍රියාකරුවකු නොවන පොදු ප්‍රවාහකයකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා කිසිම සමාගමකට බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් නොතිබිය යුතු ය.

එසේ වුව ද, මේ නියෝගයේ සඳහන් යම් සමාගමක කොටස් දරන ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු එම කොටස් දරන්නන් ශ්‍රී ලංකවේ පුරවැසියකු නොවන්නකුගේ නාමිකයෙකු හෝ භාරකරුවකු හෝ නියෝජිතයකු වශයෙන් නම් එම තැනැත්තා එම කොටස් හෝ ඒ කොටස්වල යම් පංගුවක් දරන්නකු ලෙස සළකනු නොලැබිය යුතු ය.

එසේ ම තවදුරටත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබුවහොත් එම සමාගම විසින් කොටස් හිමියන්ගෙන් ලබාගත් දිවුරුම් ප්‍රකාශකයක් මඟින් තත් කාර්යය සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

6. ප්‍රවාහන ලේඛනයක් හෝ ප්‍රේරක නියෝජිත භාණ්ඩ ලදුපතක් හෝ ජාත්‍යන්තර භාණ්ඩ ගෙනයාමේ සේවාවලට සම්බන්ධ පූර්ණ සවිස්තරාත්මක සේවා ඇතුලු වෙනත් සියලු සම්බන්ධිත සේවාවන් සපයනු ලබන නැව් බඩු ගෙනයන්නකු හෝ යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයකු වන ඉල්ලුම්කරුවකුට පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව "ඒ " පන්තියේ (Class A) බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නමට රුපියල් ලක්ෂ පහක (රු. 5,00,000) වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ජාත්‍යන්තර ප්‍රවාහන සේවා පිළිබඳ අවම වශයෙන් අවුරුදු පහක පළපුරුද්දක් ඇති මාණ්ඩලික නිලධරයකු කාර්ය මණ්ඩලයේ සේවයේ නියුක්තව සිටිය යුතු ය.

(ඇ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ නැව් බඩු ගෙනයන්නකු ලෙස ලියාපදිංචි වී සිටිය යුතු ය.

(ඈ) ඉල්ලුම්කරු අවම වශයෙන් ඇමරිකන් ඩොලර් ලක්ෂ එකක (US$ 1,00,000) නැව්බඩු ගෙනයන්නන්ගේ සියලු ආපදා වගකීම් රක්ෂණ ආවරණයක් සහ අවම වශයෙන් ඇමරිකන් ඩොලර් පනස් දහසක (US$ 50,000) වැරදීම් හා නොකර හැරීම් සඳහා වූ රක්ෂණ ආවරණයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිගනු ලබන රක්ෂණ සමාගමකින් ලබාගෙන තිබිය යුතු ය.

(ඉ) අන්තරාදායක නැව් හෝ ගුවන් භාණ්ඩ ඇතුලුව නැව් හෝ ගුවන් භාණ්ඩ පිළිබඳ කටයුතු කිරීමේ වෘත්තිය පුහුණුවකින් පිළිගත් ආයතනයකින් සම්පූර්ණ කර ඇති සහ ඒ පිළිබඳ වලංගු සහතිකයක් දරන තැනැත්තන් අවම වශයෙන් දෙදෙනෙක් ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවයේ නියුක්තව සිටිය යුතු ය.

(ඊ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, වගකීම් රක්ෂණ ආවරණ නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් මගින් පිළිගනු ලැබ ඇති හෝ ජාත්‍යන්තර නැව්බඩු ගෙනයන්නන්ගේ සංගමයේ නෞභාරපත්‍ර නිකුත් කිරීම සඳහා පිළිගනු ලැබ ඇති "සම්මත වෙළඳ කොන්දේසිවලට" අනුකූලව ක්‍රියා කළ යුතු ය.

7. නෞභාරපත්‍රය, ගෘහස්ත නෞභාරපත්‍රය, සමුද්‍රික නෞභාර පත්‍රය, ගුවන් නෞභාරපත්‍රය, ගෘහස්ථ ගුවන් නෞභාරපත්‍රය, බහුවිධ ප්‍රවාහන ලේඛනය, ප්‍රේරක නියෝජිත ලදුපත වැනි ජාත්‍යන්තර නැව් බඩු ප්‍රවාහනය සඳහා භාණ්ඩ රැගෙන යාමේ ලේඛන නිකුත් කිරීම හැර, දේශීය වශයෙන් නැව් බඩු ගෙනයාම සහ ප්‍රවාහනයට අදාළ සේවා සැපයීම සිදු කිරීමෙහි නියැලී සිටින ඉල්ලුම්කරුවෙකුට පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව බී පන්තියේ (Class B) බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය :

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නමට රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 2,50,000) බැංකු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ නැව් බඩු ගෙනයන්නකු ලෙස ලියාපදිංචි වී සිටිය යුතු ය.

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, වගකීම් රක්ෂණ ආවරණ නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් විසින් පිළිගනු ලැබ ඇති හෝ ජාත්‍යන්තර නැව් බඩු ගෙනයන්නන්ගේ සම්මේලනයේ නෞභාරපත්‍ර නිකුත් කිරීම සඳහා පිළිගනු ලැබ ඇති "සම්මත වෙළඳ කොන්දේසිවලට" අනුකූලව ක්‍රියා කළ යුතුය.

8. (1) මේ නියෝග ප්‍රකාරව නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම කලින් අවලංගු කරනු ලැබුවහොත් හෝ අත්හිටුවනු ලැබුවහොත් මිස, එම බලපත්‍රය නිකුත් කරනු ලැබූ වර්ෂයේ දෙසැම්බර් මස තිස්එක් වැනි දිනය දක්වා වලංගුව පැවතිය යුතු ය.

(2) සෑම නැව් බඩු ගෙනයන්නකු හෝ යාත්‍රා ක්‍රියාකරුවෙකු නොවන පොදු ප්‍රවාහකයකු විසින් ම රුපියල් දහ දහසක (රු. 10,000) වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.

9 (1) බලපත්‍රක් අලුත් කිරීම සඳහා වන සෑම ඉල්ලීමක් ම මෙහි උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව ඉදිරිපත් කළ යුතු ය.

(2) යම් වර්ෂයක් සඳහා බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම ඊට පෙර වර්ෂයේ නොවැම්බර් මස තිස් වැනි දින හෝ එදිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

10. නැව් බඩු ගෙනයන්නකුගේ හෝ යාත්‍රා ක්‍රියාකරුවකු නොවන පොදු ප්‍රවාහකයකුගේ ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන සෑම බලපත්‍රලාභියකු විසින් ම, මහජන යහපත උදෙසා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

11. මේ නියෝග යටතේ නියම කර ඇති පරිදි ඉදිරිපත් කරන ලද යම් ප්‍රකාශයක හෝ දිවුරුම් පත්‍රයක අන්තර්ගත වූ යම් තොරතුරු හෝ විස්තර වැරදි හෝ අසත්‍ය බවට අනාවරණය කරගනු ලැබුවහොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම සමාගමට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමට හෝ එය අස්කර ගැනීමට හෝ අත්හිටුවීමට හෝ එම සමාගමට ප්‍රදානය කර ඇති යම් වරප්‍රසාදයක් අස්කර ගැනීමට හෝ අත්හිටුවීමට වහාම පියවර ගනු ලැබිය හැකි ය.

### උපලේඛනය

*(2 වැනි සහ 9 වැනි නියෝග)*

නැව්බඩු ගෙනයන්නකු හෝ යාත්‍රා ක්‍රියාකරුවකු නොවන පොදු ප්‍රවහකයකු වශයෙන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලීම.

1. ඉල්ලුම්කරුගේ නම :..................................................................................
2. ලියාපදිංචි ලිපිනය :..................................................................................
3. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද අංකය සහ දිනය :......................
   (i) සමාගමේ ලියාපදිංචි අංකය :..................................................................
   (ii) සංස්ථාගත කළ දිනය :..........................................................................
4. ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය :......................................................................
5. දුරකථන අංකය : .................ෆැක්ස් අංකය :...................................................
   ඊමේල් ලිපිනය :..................................................................................
6. පුද්ගලික සමාගමක් ද නැතහොත් පොදු සමාගමක් ද යන්න සඳහන් කරන්න :..........................
7. සමාගමේ ගෙවා නිම කළ ප්‍රාග්ධනය :......................................................................
8. සමාගමේ යම් විදේශීය කොටස් හිමිකාරිත්වයක් ඇත්නම් ඊ පිළිබඳ විස්තර :.............................
9. බැංකු ඇපකරය පිළිබඳ විස්තර :...........................................................
10. ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි වී ඇති අංකය :............
11. සියලු ආපදා වගකීම් රක්ෂණ ආවරණය පිළිබඳ විස්තර :..................................................
12. 6 වැනි නියෝගයේ (ආ) ඡේදයේ සඳහන් කර ඇති මාණ්ඩලික නිලධාරියාගේ නම සහ ජාත්‍යන්තර ප්‍රවාහන සේවා ක්ෂේත්‍රය පිළිබඳව ඔහුට ඇති පළපුරුද්ද:.........................................................
13. කලින් පැවති බලපත්‍රය පිළිබඳ විස්තර : (අදාළ වන්නේ නම්) වර්ෂය:.....................................
14. ඉල්ලුම්කාර නැව්බඩු ගෙනයන්නා/යාත්‍රා ක්‍රියාකරුවකු නොවන පොදු ප්‍රවාහකයා විසින් පසුගිය වර්ෂ තුන ඇතුළත ශ්‍රී ලංකාව තුළ කටයුතු කරන ලද නැව් බඩුවල ප්‍රමාණය (එක් එක් වර්ෂය සඳහා ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් දක්වන්න):.......................................................................

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් වෙනසක් සිදු වුවහොත් සහ සමාගම ඇමතීමට ලබා දී ඇති විස්තරවල වෙනසක් සිදු වුවහොත් ඒ පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දීමට අප එකඟ වෙමු.

මේ බලපත්‍රය මගින් ආවරණය වී ඇති කටයුතුවලට අදාළ ලිඛිත නීතියට අදාළ විධිවිධාන පිළිබඳව අප හොඳින් දන්නා බව ස්ථිර ලෙස ප්‍රකාශ කරමු.

1972 අංක 10 දරන නැව්බඩු නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම් කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අධිකාරිය යටතේ හැර නව්බඩු ගෙනයන්නකු හෝ කන්ටේනර් මෙහෙයුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීමට උද්දේශිතව අප විසින් යම් සමාගමකට, හවුල් ව්‍යාපාරයකට, පුද්ගලයකුට හෝ සංස්ථාවකට යම් සේවාවක් සැලසීම කරනු නොලබන බවට මෙයින් ප්‍රකාශ කරමු.

අපගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව මෙම ඉල්ලීමේ අන්තර්ගත සියලු ප්‍රකාශ සත්‍ය හා නිවැරිද බවට අපි ප්‍රකාශ කරමු.

……………………………
අධ්‍යක්ෂ/අධ්‍යක්ෂවරුන්ගේ නම්/නම් සහ අත්සන/අත්සන්

දිනය :……………

*සැ. යු.* : සියළු අදාළ සහතිකවල/ප්‍රකාශවල සහතික පිටපත් අමුණා ඇත.

08-418

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.